# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,724/8 — 1966 දෙසැම්බර් 9 වැනි සිකුරාද — 1966.12.9**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### වෙළඳ වාහන සඳහා වෙන් කිරීම

1. පහත දැක්වෙන අයුරු යොදවා ඇති වාහන වල ලියාපදිංචි අයිතිකරුවන්ගෙන් ලැබෙන මේ සමග දක්වා ඇති ආකෘතියේ පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර සලකා බලනු ඇත.

(අ) තේ, රබර් සහ පොල් අතු වැඩ.

(ආ) ප්‍රවාහණය, ඉංජිනේරු සහ සමුපකාරය ඇතුළත් වෙනත් සේවා සඳහා.

අවුරුදු 10 කට වඩා පැරණි ලොරි (එනම් ප්‍රථම වරට 1956 ඔක්තෝබර් 1 දිනට ප්‍රථමයෙන් ලංකාවේ ලියාපදිංචි කරන ලද ලොරි) සහ 1965 ඔක්තෝබර් 1 දිනට ප්‍රථමයෙන් අයදුම් කරුගේ නමින් ලියාපදිංචි කරන ලදුව, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන දිනය දක්වා ඔහු විසින් ම හිමිකම් තබාගත් ලොරි වෙනුවට අලුත් ලොරි මිලදී ගැනිම සඳහා ය.

2. මෙම දැන්වීම යටතේ ඉල්ලුම් පත්‍ර පිටපත් 2 කින් යුක්තව මෝටර් ප්‍රවාහණ කොමසාරිස්, කාර්මික ශාඛාව, අංශ 1, තැ. පෙ. 533, කොළඹ, වෙත 1967 ජනවාරි 17 දින හෝ ඊට කලින් ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ අග වම් කෙළවරේ "වෙළඳ වාහන සඳහා වෙන් කිරීම" යන්න ලිවිය යුතුය. සාම අතින්ම මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන හෝ ප්‍රමාද වූ හෝ ඉල්ලුම් පත්‍ර කිසිම හේතුවක් නිසා සලකා බලනු නොලැබේ.

3. අයදුම් කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර තහවුරු කිරීම සඳහා, අවශ්‍ය වුවහොත් ලියාපදිංචි කිරීමේ සහතික, වෙළඳ ගිණුම් ආදියේ මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

4. සමාදාන විනිශ්චයකාරයෙක් ඉදිරිපිටදී රුපියලක මුද්දරයක් පිට අත්සන් කොට ඉල්ලුම පත්‍රයේ දක්වා ඇති කරුණු නිවැරදි බවට සහතික කළ යුතු ය.

ඩී. රාජේන්ද්‍ර,
මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්.

1966 දෙසැම්බර් මස 7 වැනි දින.
කොළඹ 5,
මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුවේ දීය.

### ඉල්ලුම් පත්‍රය (පිටපත් දෙකකින් විය යුතුය)

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :————.

2. කාණ්ඩ අක්ෂරය (පහත (අ) සටහන අනුව) :————.

3. දැනට හිමිව ඇති සියලුම වාහන වල විස්තර :————.

ඒවායේ හැඳින්වීමුම් (ලියාපදිංචි) අංක, වාහනවල වර්ග සහ විස්තර, අවුරුදු හා මාස වලින් වයස. ධාවනය කරන ලද සැතපුම් ගණන ආදිය.

4. මාරුකිරීමට බලාපොරොත්තු වන වාහනයේ/වාහනවල විස්තර :————.

ඒ එක් එක් වාහනයක හැඳින්වීමේ (ලියාපදිංචි) අංකය, එහි වර්ගය, විස්තරය, අවුරුදු සහ මාසවලින් වයස, සම්පූර්ණ සැතපුම් ගණන, වාහනය/වාහන ප්‍රථම වරට ලියාපදිංචි කළ දින සහ ඉල්ලුම්කරුගේ නමින් ඒවා ලියාපදිංචි කළ දින, 1965 සහ 1966 වර්ෂවලට බලපත්‍ර ලබාගෙන තිබේද, එසේ නම් කා විසින්ද සහ බලපත්‍ර අංක.—

5. අවශ්‍යව ඇති එක එක වාහනයක විස්තර :—

(අ) අවශ්‍ය වාහනයේ මෝස්තරය (ලොරි, බඩුවෑන්, ලෑන්ඩ් රෝවර්, ජීප් හෝ මෝටර බයිසිකල (පහත "ඇ" සටහන අනුව) :————.

(ආ) වර්ගය, වාහනයේ සම්පූර්ණ බර (ගෙනයාමේ ප්‍රමාණය එකතුව තාරබර) :————.

(ඇ) මෙරට වෙළඳුන්ගේ නම් සහ ලිපින :————.

(ඈ) මිල, ආරක්ෂණය, වාහනකුලිය වටිනාකම (පහත "ආ" සටහන අනුව) :————.

(ඉ) නිශ්පාදිත රට :————.

6. අවශ්‍යතාවයන්ගේ සාරාංශය :—

(අ) වාහනවල විස්තර ඇතුලුව අවශ්‍ය සම්පූර්ණ වාහන ගණන :————.

(ආ) මි. ආ. වා. වටිනාකම එකතුව :————.

(ඇ) කැමැති වන වාහන වල වර්ග—වැඩි කැමැත්ත අනුව :————.

7. ව්‍යාපාරයේ විස්තර :—

(අ) තේ, රබර් හෝ පොල් වතුනම් පහත පෙනෙන විස්තර සපයන්න :—

(1) වත්තේ නම සහ ප්‍රධාන නිශ්පාදනය :————.

(2) පිහිටීම :————.

(3) ප්‍රමාණය :————.

(4) තේ හෝ රබර් වතුනම් තේ හෝ රබර් පාලක විසින් දෙන ලද ලියාපදිංචි අංකය සහ පොල් වතුනම්, පොල් නැවත වගා කිරීමේ දෙපාර්තමේන්තුවෙන් දෙන ලද පෝර අවසර පත්‍ර අංකය (හැකි විට) :————.

(5) වගාකොට ඇති අක්කර ගණන :————.

(6) වාර්ෂික නිෂ්පාදන (1965) :————.

(7) වෙනත් අදාළ කරුණු :————.

998/25——ආර් ආර් 19601—10,975 (66/12)

(ආ) ඉංජිනේරු සහ වෙනත් සේවා ප්‍රවාහණය නම් පහත දක්වෙන විස්තර සපයන්න :—

(1) ව්‍යාපාරයේ ස්වභාවය :————.

(2) වාර්ෂික නිෂ්පාදනයේ වටිනාකම—1965 :————.

(3) යොදවා ඇති කම්කරුවන්ගේ ගණන :————.

(4) වෙනත් අදාළ විස්තර :————.

ස. යු.—පැහැදිලි කිරීම—

(අ) අ. හෝ ආ. කාණ්ඩය දෙවෙනි කොටුවේ සඳහන් කරන්න.

අ. කාණ්ඩය—තේ, රබර් සහ පොල් වතු

ආ. කාණ්ඩය—ප්‍රවාහනය, ඉංජිනේරු සහ වෙනත් සේවා

(ආ) ලොරියක හෝ බඩු වෑන් එකට මිල, ආරක්ෂණය, වාහන වටිනාකම දැක්විය යුත්තේ ඇන්ජිමත් සමන වැසියට ය.

(ඇ) තේ, රබර් සහ පොල් වතු ආදිය සඳහා වූ වැඩ වලට පමණක් මෝටර් බයිසිකල වලට ඉල්ලුම් පත් සලකා බලනු ඇත.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

නරාතිරම :————.

දිනය :————.

ඉහත දක්වා ඇති විස්තර සෑම අතින්ම සත්‍ය සහ නිවැරදි බව මම ස්ථිරකොට දිවුරා කියා සිටිමි.

මා ඉදිරිපිටදී

————.
සමාදාන විනිශ්චයකාර.

ඉල්ලුම්කරුගේ අත්සන.
(රුපියලක මුද්දරයක් පිට)

12-688